ක්‍රිස්මස් දූපත

මේ ක්‍රිස්මස් දූපතට (Christmas Island) මා යන පළමු වතාවය. එය ගැන අසා තිබුණ නමුත් තොරතුරු දැනගන්නට මම අන්තර්ජාලය තුළින් විමසුම් කළෙමි. මගේ ගමනට පෙර මා යන තැන කෙබඳු තැනක්දැයි දැනගන්නට මට අවශ්‍ය විනි. පර්ත් නුවර සිට ගුවනින් කි.මී. 2650 දුරින් පිහිටි මෙය ඔස්ට්‍රේලියාව සතු ප්‍රාන්තයකි. ඊට ආසන්නම රට ඉන්දුනිසියාවේ ජාවා දූපතට එහි සිට ඇත්තේ කි. මී. 360කි. ක්‍රිස්මස් දූපතට තවත් කි.මී. 600 පමණ දුරින් පිහිටි කොකොස් දූපත්ද ඔස්ට්‍රේලියාවේ පාලනයට නතුව තිබේ.

මා ගමන් ගත් යානය පර්ත් ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පිටත් වූයේ පෙරවරු 9.00ටය. පර්යන්තයට අපිද ගොස් යානයට නැගීමට අපිට සිදුවිය. එය FAKKER 100 වර්ගයේ මගින් 100යට පමණ යා හැකි කුඩා මගී ගුවන් යානයකි. ගුවන් ගතවී මොහොතකට පසු අඩි 3000 පමණ ඉහළින් පියාසර කරන්නට වූ යානය බටහිර ඔස්ට්‍රේලියාවේ වෙරළ බඩ තීරුව දිගේ ඉහළ අහසේ ගමන් ගන්නා විට දිස්වූයේ අපූරු දසුනකි. වැලිකඳු, ගහක් කොළක් නොමැති වියළි බිම්, දුඹුරු පැහැති තැනිතලා බිම්, අතරින් පතර ලදු කැලෑ, මිටි ගසක් දෙකක්, ඉදිහිට ගලාගිය දිය කළුරක්, නෙතට තැනින් තැන දිස්වේ.

ඔස්ට්‍රේලියාවේ උතුරු පෙදෙසේ කර්කශ භාවය කෙබඳු දැයි සිතාගන්නට මට හැකි වූයේ ගුවන් යානය ඉන්ධන ලබාගැනීම සඳහා LEARMONTH නම් වූ කුඩා ගුවන් තොටුපළේ ධාවන පථයට බට මොහොතේය. පෙනෙන තෙක් මානයක ක්ෂිතජය දක්වා විහිදී ගිය දුඹුරු වර්ණය තැනිතලා බිම් හා අතරින් පතර ගහකොළුන් හැරෙන්නට මිනිස් වාසයක ලකුණක්වත් නොපෙනෙයි. යානයේ කවුළුවෙන් පිටත බලන මට ඉන්ධන ටැංකියකින් යානයට ඉන්ධන ලීටර් 5000ක් පිරවූ බව සඳහන් වේ.

LEARMONTH හි පැයහාගයක් පමණ ගතකළ යානය දැන් නැවතත් ගුවනට නගී. ළඟම නවතා ඇති SKY WEST යානය නොසෙල්වී බලාසිටින සෙයකි. අප යානය තුළ සිටින්නේ මගින් 20 පමණ සංඛ්‍යාවකි. මේ සියලු දෙනාම ක්‍රිස්මස් දූපත බලා යන වුන්ය. කාර්යමණ්ඩලයේ ලලිතාවන් දෙදෙනෙක් මා පිටුපස අසුනක සතුටු සාමිචියක යෙදෙමින් සිනාසෙනු ඇසේ. තවත් මගීන් කිහිපදෙනෙක් නිදි කිරති. ගුවන් තොටුපළේදී මට හමුවූ මගීන් කිපදෙනෙක්ම එහි යන්නේ භාෂා පරිවර්තකයන්, රැකවලුන්, ආගමන විගමන දෙපාර්තුමේන්තු නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන වල නියෝජිතයන් ආදී විවිධ රාජකාර්ය කරන්නන් ලෙසය. දැන් ක්‍රිස්මස් දූපත ඔස්ට්‍රේලියාවට නීති විරෝධීව පැමිණෙන්නන් රඳවා තබන කඳවුරු පිහිටි ස්ථානයකි.

1958 ජනවාරි 1 වැනිදා ක්‍රිස්මස් දූපත බ්‍රිතාන කිරීටයට යටත් විජිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදුව, එම වසරේම ඔක්තෝම්බර් 1 වැනිදා එය ඔස්ට්‍රේලියාව පාලනය යටතට ගනු ලැබිණ. මේ සඳහා ඔස්ට්‍රේලියාව පවුම් මිලියන දෙකක් සිංගප්පුරුවට ගෙවා ඇත. මෑත කාලය තුළ පොස්පෙට් නිෂ්පාදන කටයුතු ක්‍රමයෙන් සීමා කිරීමෙන් පසු මෙය ජනගහනය 1200 පමණ දක්වා අඩුවී මෙම දිවයිනේ වත්මන් ජනගහනයෙන් 85% පමණ චීන ජාතිකයන්ගේද 10% පමණ මැලේ ජාතිකයන්ගෙන්ද ඉතිරිය අනෙකුත් ජාතිකයන්ගේද සෑදී ඇත. ආගම වශයෙන් බලන විට බෞද්ධයෝය. දඹදිව සිට ගෙන එන ලද ශ්‍රී මහා බෝධි වෘක්ෂයේ ශාඛාවක් මෙහි තිබෙන විහාරස්ථාන භූමියේ සිටුවා ඇත.

මොහොතකින් යානය නිල-හරිත වර්ණ සමුදුර මතින් පියාසර කරයි. තවමත් ගොඩබිමේ පටු තීරය මතින් මට දෙපසින් මහ සමුදුර දැකිය හැකිය. පහත බලන විට කඩතොළු වූ රැළි බිම් හරහා සමුදුරට ගලායන සිහින් දියපාරවල් කිහිපයක් ඇතිනේ පෙනේ. කෙමෙන් ඔස්ට්‍රේලියා වෙරළ පසුකර යානය මහ සමුදුර මතින් පියාසර කරන විට පහතින් පෙනෙන්නේ ඝණ නිල්පැහැති සමුදුරු ජලය පමණි. වළාකුළෙන් වැසී ගිය ඈත තෙරක් නොපෙනෙන අහස පමණි දැන් දිස්වන්නේ, ක්ෂිතජය ලං නොවේ.

අප පොළොවට අඩි 26000 උසින් දැන් පියාසර කරන බව ගුවන් නියමුවා අපට දැනුම් දෙයි. ක්‍රිස්මස් දූපතට තව පැය දෙකකින් පමණ ගොඩබසින බව ඔහු කියයි.

පිටත බලන මට, සුදු වළාකැට පෙළක් යානයට පහතින් අහසේ පැතිර තිබෙනු පෙනෙයි. ගුවන් සේවිකාවන් දිවා ආහාරයට යමක් ගෙනවිත් මා වෙත දිගු කරන්නීය. ගුවන් යානාවල දෙන ආහාර බොහෝ විට නීරසය. කුසගින්නක් නැතත් මම එය ගිලදමන්නට උත්සහ කරමි. ඔරලෝසුවේ වේලාව පැය 2 අඩුකරගන්නා ලෙස ගුවන් නියමුවා කියයි. අපි ඔස්ට්‍රේලියාවේ වයඹ දෙසට පියාසර කරමින් සිටිමු. නුතුරු නුපුරුදු පරිසරයකට තව පැය දෙකකින් පමණ පිවිසෙනු ඇත. ඝන කළු වලාපෙළක් සුදු වළා රොද මතින් වේගයෙන් අප පසුකර යන හැටි පෙනෙයි. යලිත් සුදු වළාකැට සමුදුර වසා ඕලු ඇතිරල්ලක් ලෙස දිස්වන්නට වෙයි. මම කියවන්නට ගෙනා පොතක් දිග හැරියෙමි. ක්‍රිස්මස් දූපතට යානය පතිත වන විට මට ඇහැරුණි. මා එක් කරගෙන යන්නට සම්බන්ධීකරණ නිලධාරිනි පැමිණ සිටියාය.

මඳ විවේකයකින් පසු මම ක්‍රිස්මස් දූපත ගැන කරුණු සොයන්නට පටන් ගතිමි.

මෙය, වර්ග කිලෝමීටර් 135 ක වපසරියකින් යුතු ඉන්දීය සාගරයේ පිහිටි නිවර්තන කලාපීය දූපතකි. වසර මිලියන ගණනාවකට පෙර නිෂ්ක්‍රීය බවට පත් ගිනිකන්දක් මුහුදු පත්ලේ විපර්යාස නිසා මුහුදින් ඉහළට එසවී නිර්මාණය වී ඇති මෙය එම ගිනිකන්දේ ශිඛරය බව භූ විද්‍යාඥයෝ කියති. දිවයින වටේම හුණු ගලින් සැදුණු රළු ගල්වැට හැරෙන්නට වැලි සහිත වෙරළක් නැති තරමිය. මෙය ස්වභාවික පරවලින් ආරක්ෂා වී තිබීම නිසා 17 වැනි සියවස තෙක්ම මිනිස් වාසයක් නොවී පැවතුණ බව නිගමනය කළ හැක. කාලයක් මුලුල්ලේ දිවයින් පසු තර ගිය නැව් කොතෙක් වුවත් බ්‍රිතාන්‍ය ඉන්දීය වෙලඳ සමාගමේ ROYALMARY නෞකාවේ කප්පිත්තා වූ විලියම් ටයිනෝර්ස් 1643 දෙසැම්බර් 25 වැනිදා මේ දිවයින අසලින් යාත්‍රා කරන විට මෙයට CHRISTMAS ISLAND යන නම දුන්නේය.

1688 දී බ්‍රිතාන්‍ය ගවේෂකයකු වූ විලියම් (Dempier) ඩැම්පියර් CYGNET නම් නැවේ සිට බෝට්ටු දෙකක් ජලය ලී සහ ආහාරය පිණිස කුරුල්ලන් හා කකුලුවන් අල්ලා ගැනීමට එවූ අවස්ථාව පළමු වරට මෙහි මිනිසුන් පා තැබූ අවස්ථාව ලෙස ඉතිහාසගත විය. 18 වැනි ශතවර්ෂයේදී කිපවතාවක්ම නාවිකයන් මෙහි පැමිණියත්, 1820 දශකයේදී කොකෝස් දූපතට ආහාර හා සැපයුම් රැගෙන ගිය නැව් වලින් පැමිණි නාවිකයන් මේ දූපතට පිවිස මුහුදු පක්ෂින් සහ කකුලුවන් අල්ලාගෙන ලී ද කපා ගෙන ගිය බව වාර්තා වේ.

1887 දී EGERIA නෞකාව මේ දිවයිනේ සමීක්ෂණයක් සඳහා පැමිණ මෙහි තිබෙන උසස් තත්වයේ PHOSPATE ආදර්ශක රැගෙන යාමෙන් පසු 1888 දී දූපත බ්‍රිතාන්‍යයට අයිති බව ප්‍රකාශ කර එය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට ඇඳ ගැනීම පිණිස IMPERIEUSE නෞකාව එහි එවනු ලැබිය.

1891 හා 1897 කාලය තුළදී CHRISTMAS ISLAND PHOSPATE කොම්පැණියට පොස්පෙට් කැණීමේ පූර්ණ අයිතිය ලබාදීමෙන් පසු කැනීම් කටයුතු විශාල වශයෙන් ආරම්භ වූ ලැබිය. දිවයිනේ වාසීන් නොසිටි නිසා බ්‍රිතාන්‍ය රජයේ අනුමැතියෙන්, පොස්පෙට් කැණීම් කටයුතු සඳහා චීන ජාතික කම්කරුවන් ගෙන්වනු ලැබිය. සිංගප්පුරුවෙන් කම්කරුවෝ 200 ක් පැමිණි සහ යුරෝපීය ජාතික කළමණාකරුවන් 5 දෙනෙක් සහ සීක් ජාතික පොලිස් භටයන් 5 දෙනෙක්ද සමඟය. 1898 වසරේ දීය ඒ පළමුවෙනි පොස්පෙට් නැව 1900 දී මේ දූපතෙන් පිටත් විය. දෙවැනි ලෝක යුද්ධය ආරම්භ වන තුරු පොස්පෙට් කැණීම් හා අපනයන නැවතී තිබී නැතිව සිදු විය.

1941 දී ජපනුන් යුධයට එළඹීමත් සමඟ දූපතඟේ සිටි ගැහැණුන් සහ ළමුන් ඉවත් කනු ලැබිය. ආසියානු සේවකයන් 1100 ක් සහ යුරෝපීයයන් කීප දෙනෙකු හැරෙන්නට ආරක්ෂාව සඳහා කැප්ටන් විලියම්ස් ගේ නායකත්වයෙන් සුළු නිලධාරීන් 4 දෙනෙක්ද ඉන්දීය භටයන් 30 දෙනෙකුගෙන්ද සැදුණු හමුදාවන් සිටියේය. 1942 මාර්තු 7 වැනිදා ජපන් නාවික හමුදාව දිවයිනට ළං වන විට කැප්ටන් විලියම්ස් යටත් වීමේ සුදු කොඩිය ඉසිලීය. 1942 මාර්තු 31 වනි දා ජපන්නු දිවයිනට බෝම්බ හෙලූහ. ජපන් භටයන් 900ක් එහි ඇතුලත් වූහ. මේ අවස්ථාවේ ද ආපසු පහර දෙන්නට කැප්ටන් විලියම්ස් තීරණය කළ ද බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය වෙනුවෙන් මැරෙන්නට අකමැති වූ ඉන්දීය භටයෝ කැරලි ගැසූහ. ඉතිරි Senior ඇතුළු බ්‍රිතාන්‍ය හමුදා භටයන් මරා ඔවුන්ගේ සිරුරු මුහුදට විසි කළ ඉන්දියානුවෝ අනෙක් යුරෝපීයයන් ටික අත්අඩංගුවට ගත්හ. එහෙත් කැරැල්ලට සම්බන්ධ නොවූ එක් ඉන්දී හමුදා නිලධාරියෙක් ඔවුන්ව මරණයෙන් බේරා ගත්තේය. දිවයින යටත් කර ගත් ජපන්නු මේ සියලු දෙනාම සිරභාරයට ගත්හ. මේ අතර වැඩ කළ කම්කරුවෝ කැලයට පළාගොස් සැඟවුණහ. ඔවුන්ව බලයෙන් නැවත රැගෙන ආ ජපන්නු පොස්පෙට් නිෂ්පාදනය යළි ආරම්භ කළෝය. කම්කරුවන්ගේ සම්පූර්ණ සහය නොලැබුණත් ටොන් 4000 පොස්පෙට් ජපානයට යවන ලදී.

1943 වන විට දිවයිනය අවශ්‍ය ආහාර සැපයීම, ජපනුන්නට අපහසු විය. එබැවින් එහි සිටි කම්කරු පිරිසෙන් භාගයක්ම ඉන්දුනිසියාවේ පිහිටි සිර කඳවුරුවට වලට ගෙන යන ලදී. අනෙක් කම්කරුවන් හා යුරෝපීයන් ලී ගැනීමට හා එළවලු වගාවට යොදවන ලදහ.

දෙවැනි ලෝක මහා යුද්ධය අවසාන වීමට පසු පොස්පෙට් සමාගම ඔස්ට්‍රේලියානු නවසීලන්ත රජයන් ඒකාබද්ධව මිලදී ගනු ලැබිණ. 1946 සිට නැවතත් පොස්පෙට් නිෂ්පාදන කටයුතු ආරම්භිණි. දිවයිනේ පාලන භාරය 1948 දී සිංගප්පුරුවට පැවරිණි. මේ සමගම පොස්පෙට් නිෂ්පාදන හා අපනයන කටයුතු පුලුල් වීම නිසා මැලේසියාව, සිංගප්පුරුව හා කොකෝස් දිවයින යන රටවලින් කම්කරුවන් හා ඔවුන්ගේ පවුල් ගෙනැවිත් පදිංචි කරවීමෙන් පසු දිවයිනේ ස්ථිර පදිංචිකරුවන්ගේ වාසය ඇරඹුණි.

1958 ජනවාරි 1 වැනිදා ක්‍රිස්මස් දූපත බ්‍රිතාන කිරීටයට යටත් විජිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදුව, එම වසරේම ඔක්තෝම්බර් 1 වැනිදා එය ඔස්ට්‍රේලියාව පාලනය යටතට ගනු ලැබිණ. මේ සඳහා ඔස්ට්‍රේලියාව පවුම් මිලියන දෙකක් සිංගප්පුරුවට ගෙවා ඇත. මෑත කාලය තුළ පොස්පෙට් නිෂ්පාදන කටයුතු

21 වන පිටුවට

අනුරුද්ධ ලියනගේ

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

Professional, Quality Service Assured

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila